# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2078/52 - 2018 ජූලි මස 06 වැනි සිකුරාදා - 2018.07.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය*: කැප්‍රාලේ/8/4/84(II)
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/8/2014/පීසී/101.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*අවශ්‍ය මහජන කාර්යය :- කැස්බෑව වැව පුළුල් කිරීම ආශ්‍රිත කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම.*

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය :- ඉහත කී ප්‍රදේශයේ විස්තරය :-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙමළදූව ගමේ පිහිටි කොට්ඨාස අංක 572 බී කැස්බෑව නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් 2017.11.21 දිනැතිව පිලියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 521210 කලාප අංක 05 පත්‍ර අංක 2 හි පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.5331 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (03) ;

01. කැබලි අංක 351
ඉඩමේ නම: වැව ඉහල කුඹුර; විස්තරය: අත්හරින ලද කුඹුර; හිමිකම් කියන අය: හේනාධීර පතිරගේ නිහාල් ධනුසිරි දසනායක, අංක 446/7, මීගහ පෙදෙස, තිඹිරිගස්යාය, කොළඹ 05; ප්‍රමාණය: හෙක්. 0.1165.

02. කැබලි අංක 352
ඉඩමේ නම: වැව ඉහල කුඹුර; විස්තරය: අත්හරින ලද කුඹුර; හිමිකම් කියන අය: පී. ආර්. ඩිංගිරි මහත්තයා, අංක 112/ඒ, හොරණ පාර, කැස්බෑව; ප්‍රමාණය: හෙක්. 0.1396.

03. කැබලි අංක 353
ඉඩමේ නම: වැව ඉහල කුඹුර; විස්තරය: අත්හරින ලද කුඹුර; හිමිකම් කියන අය: හේනාධීර පතිරගේ සුරනිමල රංජිත් දසනායක, අංක 165/1, ඥාණේන්ද්‍ර මාවත, නාවල, රාජගිරිය; ප්‍රමාණය: හෙක්. 0.2770

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනා තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් 2018 ජූලි මස 24 වැනි දින පූ.භා. 9.30 ට කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2018 ජූලි මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම

ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 02ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

වයි. කේ. එස්. ජීවමාලා,
ප්‍රාදේශීය ලේකම්/
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,
කැස්බෑව.

2018 ජුනි මස 29 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-648

---

## සංශෝධනය

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය*: කැප්‍රාලේ/අත්3/1/78.

වර්ෂ 2017 ක් වූ දෙසැම්බර් මස 05 වැනි දින අංක 2048/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* පලකරන ලද බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, අංක 535 පැපිලියාන බටහිර සහ අංක 535 සී පැපිලියාන නැගෙනහිර ග්‍රාම නිලධාරි වසම්වල මූලික පිඹුරු අංකය කො. 9399 දැන්වීමේ සඳහන් විස්තරය පහත වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දී සිටිමු.

**කැබලි අංක 100**

ඉඩමේ නම: සුනේත්‍රාදේවි පාරේ වරිපනම් අංක 449 දරන ඉඩමේ කොටසක්; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අයඃ ඒ. එල්. සේනාරත්න, අංක 449, සුනේත්‍රාදේවි පාර, පැපිලියාන; ප්‍රමාණය: හෙක්. 0.0054.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2018 ජූලි මස 26 වැනි දින පෙ.ව. 9.30 ට කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2018 ජූලි මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

වයි. කේ. එස්. ජීවමාලා,
ප්‍රාදේශීය ලේකම්/
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,
කැස්බෑව.

2018 ජූලි මස 03 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-649

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.